ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

# ලංසු කැඳවීම

## මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශය සඳහා ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

01. මාර්ග සංවර්ධන අධිකාරියේ අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශයේ (අ.මා.මෙ.න හා ක ඒකකය) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, එම අංශයෙහි පහත දැක්වෙන ව්‍යාපෘතිය සඳහා **ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී සිටින පිළිගත් සේවා සපයන** යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | සේවා සැපයිය යුතු ස්ථාන | කොන්ත්‍රාත් කාලය (දින) | ලංසු ආරක්ෂණය (රු.) |
|---|---|---|---|---|
| RDA/EOM&M/Sec-Ser/CE/2023/08 | අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශය සඳහා ආරක්ෂක සේවාව සැපයීම - මධ්‍යම අධිවේගී මාර්ගය | මීරිගම, දම්බොක්ක, නාකලගමුව කුරුණෑගල, යග්ගපිටිය, | 365 | 100,000.00 |

02. මාර්ග සංවර්ධන අධිකාරියේ අ.මා.මෙ.න. හා ක. ඒකකය ක්‍රියාත්මක නියෝජිත ආයතනය වේ.

03. ලංසු කැඳවීම ජාතික තරඟකාරි ලංසුකරණ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරුවන්, මේ හා සමාන ධාරිතාවයකින් යුත් කම්කරු සැපයුම පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

05. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් **(2023.11.03)** දක්වා ලංසුව වලංගු විය යුතුය.

06. ලංසු, ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතුය. (**2023.12.01**) දින දක්වා වලංගු විය යුතුය.) වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ලංසුකරු විසින් ලංසු ලියකියවිලිවලට අයත් සෑම පිටුවකම අත්සන් යොදා කාර්යාලීය මුද්‍රාව තැබිය යුතුය.

08. පූර්ව ලංසු රැස්වීම **2023.07.27 දින 11.30** මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශය කහටගහහේන, වල්ගම. බණ්ඩාරගම කාර්යාලයේදී පැවැත්වේ.

09. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන රු. **3,000.00 +** අදාළ වන බදු සමග ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම දරන ස්ථානයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන ඒකකයේ අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2023.07.14 දින සිට 2023.08.03 දින** දක්වා පෙ.ව. 9.00 පැය සිට ප.ව. 2.00 පැය දක්වා කාලය තුළ ලබා ගත හැකිය. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, ඒජන්ත/නියෝජිතවරයා සහ ටෙන්ඩරයේ සාර්ථක ජයග්‍රාහකයින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩරයට අදාළව ලියාපදිංචි වී සිටිය යුතුය. **2023.08.04** වන දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වේ.

10. ලංසුව හා පිටපතක් (මුද්‍රා තබන ලද) **2023.08.04** වන දින **ප.ව. 02.00** ට පෙර **අධ්‍යක්ෂ, අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශයේ ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමණාකරන ඒකකය, කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ලංසුපත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"ආරක්ෂක සේවාව සැපයීම - මධ්‍යම අධිවේගී මාර්ගය"** සඳහන් කළ යුතුය.

11. කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම දරන ස්ථානයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශයේ අධ්‍යක්ෂ කාර්යාලයේ දී ලංසු භාරගැනිම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

12. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක :

- ඉංජිනේරු (අ.මා.මෙ.න. හා ක අංශය), මාර්ග සංවර්ධන අධිකාරිය දු.ක. 038-2289201

සභාපති,
අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරණ අංශයේ ප්‍රසම්පාදන කමිටුව,
මාර්ග සංවර්ධන අධිකාරිය,
කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම.